# දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය (CSIAP) සඳහා ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම.

## කෘෂිකර්ම අමාත්‍යාංශය

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ (MSD) චක්‍රලේඛ අංක 01/2019 සහ රජයේ බඳවාගැනීම් ක්‍රියාපටිපාටීන් ප්‍රකාරව, ලෝක බැංකුවේ අරමුදල් සපයනු ලබන දේශගුණික සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය (CSIAP) සඳහා "කොන්ත්‍රාත් පදනමින්" කාර්යමණ්ඩල සාමාජිකයන් බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ (MSD) අංක 01/2019 චක්‍රලේඛයේ වගු අංක 03 හි මෙම තනතුරු සඳහා වැටුප් ප්‍රමාණයන් සඳහන් කර ඇත.

අයදුම්රුවන් වයස අවුරුදු 64 කට අඩු අය විය යුතුය. ඉංග්‍රීසි භාෂා ප්‍රවීනත්වය හා රජයේ රෙගුලාසි පිළිබඳ දැනුවත්භාවය සමඟ පරිගණක සාක්ෂරතාවය අත්‍යාවශ්‍ය පූර්ව සුදුසුකම් වේ. ශ්‍රී ලංකාවේ විදේශ අරමුදල් යෙදවූ ව්‍යාපෘතිවල සේවය කොට තිබීම අමතර සුදුසුකම් වේ.

| අංකය | PS වර්ගීකරණය | තනතුර | තනතුරු ගණන | අදාළ චක්‍රලේඛය |
|---|---|---|---|---|
| 01 | PS 3 | දේශගුණ සුහුරු කෘෂිකර්ම විශේෂඥ, නැගෙනහිර පළාත සඳහා | 01 | MSD චක්‍රලේඛ 01/2019 |
| 02 | PS 4 | ව්‍යාපෘති ගණකාධිකාරි, නැගෙනහිර පළාත සඳහා | 01 | |
| 03 | PS 5 | ජ්‍යෙෂ්ඨ තාක්ෂණ නිලධාරි, වයඹ පළාත සඳහා | 01 | |
| 04 | PS 6 | පරිසර ආරක්ෂණ නිලධාරී, වයඹ පළාත සඳහා | 01 | |

අවශ්‍ය වැඩිදුර තොරතුරු සඳහා www.csiap.lk අඩවිය වෙත යොමු වන්න.

එක් එක් තනතුර සඳහා වෙන් වෙන් වශයෙන් අයදුම්පත් සකස් කොට **2023.02.10** දිනට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, අදාළ කවරයේ ඉහළ කෙළවරේ වම් පස අයදුම්කරනු ලබන තනතුර සඳහන් කල යුතුය.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ**
**නො: 61/1, එම්. ඩී. එච්. ජයවර්ධන මාවත**
**මාදින්නාගොඩ**
**රාජගිරිය**

කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලබයි. මේ සඳහා බලපෑම් කිරීම නුසුදුසුකමක් සේ සලකනු ලබන අතර එවන් අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

ලේකම්
කෘෂිකර්ම අමාත්‍යාංශය